## උතුරු පළාත් රාජ්‍ය සේවයට පළාත් ඒකාබද්ධ සේවාවේ කාර්යාල සේවක III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඒකාබද්ධ සේවාවේ කාර්යාල සේවක තනතුරේ පවතින පුරප්පාඩු **අනූවක් (90)** සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තුමා විසින් **2018 දෙසැම්බර් මස** මෙම නිවේදනයේ 13 වන ඡේදයේ දක්වා ඇති නගරවල විභාගය පැවැත්වීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනුයේ **05.12.2018** වැනි දිනයි.

### 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසි :-

02.1 **2012.01.01** වැනි දින සිට ක්‍රියාත්මකව පවතින පළාත් ඒකාබද්ධ සේවාවේ කාර්යාල සේවක තනතුරට අදාල සේවා ව්‍යවස්ථා සංග්‍රහය හෝ බඳවා ගැනීම් පරිපාටි නිර්දේශිත කොන්දේසීන්, උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අංක G/NPC/A6/DCS(admin)/Appr/Dri/2016 හා 2018.10.01 වැනි දින දරණ ලිපිය මගින් ලබා දී ඇති අනුමැතිය ප්‍රකාරව ද, ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුවද, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක **1817/30** දරණ **2013.07.03** වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා ආයතන කාර්ය පටිපාටික සංග්‍රහය යනාදියට හා මතු පැමිණෙන කාලවලදී මෙහි කිසියම් සංශෝධනයන්ට යටත්ව තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් **කාර්යාල සේවක සේවයේ III** වන ශ්‍රේණියට පත්කරනු ලැබේ.

02.2 තරග විභාගය මගින් පත්වීම සඳහා තෝරා ගන්නා විභාග අපේක්ෂකයන් පත්වීම් දින සිට වසර (03) ක් පරිවාස කාලයට යටත්වන පදනම යටතේ **කාර්යාල සේවක සේවයේ III** වන ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිරයි විශ්‍රාම වැටුප් සහිතය. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි **කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ** තනතුරට පත් කරන ලද දින සිට **වසර තුනක (03)** කාලය තුළ පළමු කාර්යක්ෂම කඩඉම් විභාගයෙන් සමත් විය යුතුයි.

02.3 මෙම සේවාවන් ස්ථාන මාරුවීම්වලට බැඳී සේවාවන් වේ. එබැවින් මෙම පත්වීම් ලබන අපේක්ෂකයන් උතුරු පළාතේ කුමණ ප්‍රදේශයක වුවද සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන කොන්දේසියට යටත් විය යුතුයි.

02.4 එක් සේවා ස්ථානයකට පත්වීම් ලබන අපේක්ෂකයා, එම සේවා ස්ථානයේ අවම වශයෙන් අවුරුදු **පහක් (05)** අඛණ්ඩව සේවය කළ යුතුයි යන්න අත්‍යාවශ්‍ය නියෝගයකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අදාලව නිකුත් කරනු ලබන චක්‍රලේඛ යනාදීන්ට යටතේව පත්වීම් දින සිට **වසර (05)** අවසන් වීමට ප්‍රථම නියම කරන ලද දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුයි.

02.6 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත්කිරීමට අපේක්ෂා කරන සංඛ්‍යාව **අනූවක් (90)** වේ. කෙසේ වුවද දන්වනු ලබන පුරප්පාඩු සම්බන්ධයෙන් කිසියම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ නොකිරීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

### 03. වැටුප් ක්‍රමය :-

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 ප්‍රකාර, වැටුප් කාණ්ඩය **PL 1 – 2016** ට අනුව කාර්යාල සේවක සේවයේ - III වන සේවයට ඒකාබද්ධ වැටුප් අනුපාතය රුපියල් **24, 250 – 10 x 250 - 10 x 270 - 10 x 300 – 12 x 330 – 36, 410/-** ක් වේ. (රුපියල් 25,000 වැටුප් පියවරට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් වී සිටිය යුතුයි) කෙසේ වුව ද ඉහත චක්‍රලේඛයෙන් **II** – වන වගුවේ සඳහන් විධිවිධානයන් ප්‍රකාර වැටුප් ප්‍රදානය කරනු ලැබේ.

### 04. සාමාන්‍ය සුදුසුකම් :-

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

04.2 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යෝග්‍ය මනා ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි පුද්ගලයන් විය යුතු අතර මනා චරිතයකින් යුත් පුද්ගලයන් ද විය යුතුයි.

04.3 අයදුම්කරුවන් උතුරු පළාත ස්ථිර පදිංචිය කරගත් අය විය යුතුයි. මෙම අයදුම් අවසන් දිනට ප්‍රථම අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි. **(ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම සේවක නිලධාරි විසින් නිකුත් කරන සහතිකය හෝ ඡන්ද ලැයිස්තුවේ සහතික කරන ලද පිටපත ඉදිරිපත් කළ යුතුයි)**

04.4 අයදුම්පත භාරගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම මෙම තනතුර සඳහා කැඳවන ලද **සියළුම සුදුසුකම්** අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබිය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :-

### (අ) අධ්‍යාපන සුදුසුකම් :-

අ.පො.ස (සා/පෙ) විභාගයෙන් **දෙවරකට නොවැඩි වාරවලදී** භාෂාව (දෙමළ/සිංහල) ඇතුළුව අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් ඇතුළුව විෂයයන් හයක් (06) සමත්වී සිටිය යුතුයි.

### (ආ) වයස් සීමාව :-

අයදුම්පත භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුගේ වයස අවුරුදු **දහඅටට (18)** නොඅඩු හා වයස අවුරුදු **හතලිස් පහට (45)** නොවැඩිව තිබිය යුතුයි.

## 06. බඳවා ගැනීමේ ක්‍රමය :-

06.1 ලිඛිත පරීක්ෂණය මගින් කුසලතා පදනම මත, බඳවා ගන්නා අවස්ථාවේ ක්‍රියාත්මකව පවතින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, බඳවා ගන්නා ක්‍රම, ජාතික හා ප්‍රතිපත්ති යනාදීන් ප්‍රකාරව කාර්යාල සේවක තනතුරට බඳවා ගනු ලැබේ. මෙම නිවේදනයේ අයදුම්කරුවන්ගෙන් කැඳවන ලද සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා ඇති අයිතිවාසිකම් සියල්ල අහෝසි කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී කැඳවන ලද සියළුම සුදුසුකම්, ලියකියවිලි පරීක්ෂා කරනු ලැබේ. මෙහිදී ලකුණු කිසිවක් ප්‍රදානය කරනු නොලැබේ.

06.2 ඉහත ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන විභාග අපේක්ෂකයන් ලබාගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ අනුව පවතින පුරප්පාඩුවලට අනුව සම්මුඛ පරීක්ෂණයට තෝරාගනු ලැබේ. කෙසේ වෙතත්, පළාත් ඒකාබද්ධ සේවායේ කාර්යාල සේවක සේවය සඳහා වන බඳවා ගැනීම, දිස්ත්‍රික්ක ජනගහන අනුපාතය පදනම මත සිතුකෙරනු ලැබේ.

06.3 පුරප්පාඩුවලින් 03% විශේෂ අවශ්‍යතා ඇති (ආබාධිත) අය සඳහා වෙන් කරනු ලැබේ. විභාග අපේක්ෂකයා පත්වීම් සඳහා තෝරා ගන්නා විට අදාල තනතුරේ සේවය කිරීම සඳහා තම විශේෂ අවශ්‍යතාවයේ තත්වය (Disability) බාධාවක් නොවන බවට විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් ඔප්පු කළ යුතුයි. එසේ වුවත් විශේෂ අවශ්‍යතාවයක් ඇති විභාග අපේක්ෂකයෙක් පත්වීම සඳහා සුදුසුකම් ලබන්නේ ලිඛිත විභාගයෙන් සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමේ පදනම මතයි.

## 07. විභාග ගාස්තුව :-

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක රුපියල් **500.00** ක් "**ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත**" ගේ අංක **"3401"** දරණ තැන්පත් ගිණුමට බැර කරන ලද කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ අලවා යොමු කළ යුතුයි. මොනයම් හේතුවක් නිසා හෝ මෙම ගාස්තු නැවත ගෙවනු නොලැබෙන අතර මෙම ගාස්තුව වෙන විභාගයක් සඳහා මාරු කිරීමට ද අවස්ථාව දෙනු ලබන්නේ නැත.

## 08. අයදුම්කරන ක්‍රමය :-

08.1 මෙම දැන්වීම් අවසානයේ ඇති ආදර්ශ අයදුම්පතට සරිලනසේ A4 ප්‍රමාණයේ (සෙ.මී21 x සෙ.මී 29) කඩදාසියේ 1 සිට 10 දක්වා ඡේද පළමු පිටුවේ ද 11 සිට 15 දක්වා ඡේද දෙවන පිටුවේ ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **05.12.2018** වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, "**ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක :393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.2 අයදුම්පත යොමු කරන ලිපි කවරයේ වම් උඩ කෙළවරේ "**උතුරු පළාත් කාර්යාල සේවක සේවයේ III වන ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම සඳහා විවෘත තරග විභාගය - 2018**"

යනුවෙන් සඳහන් කළ යුතුයි අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08.3 අයදුම්පතේ ඡායා පිටපත තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම්පතේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත් යනාදී භාරගනු නොලැබේ. විභාගය සඳහා විභාග ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම යනු **අපේක්ෂකයා විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට** පිළිගැනීමක් සේ සැළකිය නොයුතුයි.

08.4 විභාගයට අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම අයදුම්පත් භාරගන්නා අවසන් දිනට ප්‍රථම ඉල්ලා ඇති සුදුසකම් පූර්ණය කරනු නොලබන අයදුම්කරුවන්ගේ අයදුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඒ සඳහා කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ

08.5 අයදුම්පත් ඉදිරිපත් කරන සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ හා සම්බන්ධ පුවත්පත් නිවේදනයක් ද නිකුත් කරනු ලැබේ. විභාග අපේක්ෂකයෙකුට දැන්වීම නිකුත් කර විභාග දිනයට අඩුම වශයෙන් දින තුනකට (03) පෙර හෝ විභාග ප්‍රවේශ පත්‍ර නොලැබුණේ නම්, ප්‍රවේශ පත්‍ර නොලැබීම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු සමඟ **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක** :393/48, **කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, දුරකථන අංකය - 021 221 9940)

**සටහන්** :-

ප්‍රවේශපත්‍රය සම්බන්ධ ඉල්ලීම් ලිපිය, අයදුම්පත හා විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

## 09. විභාග අපේක්ෂකගේ අනන්‍යතාවය :-

අපේක්ෂකයන් තමා පෙනී සිටින එක් එක් විෂයයන් සම්බන්ධයෙන් අධීක්ෂක සෑහීමකට පත්වන ආකාරයකට ඔබගේ අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලේඛනවලින් යම්කිසි ලේඛනයක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද ජාතික හැඳුනුම්පත් අංකය

(ii) වලංගු විදේශ බලපත්‍රය.

ඉහත සඳහන් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන විභාග අපේක්ෂකයෙකුගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත විසින් අහෝසි කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නීතිරීති උල්ලංඝනය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවන දඬුවමකට යටත් විය යුතුයි.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයෙන් නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතුයි. මෙම විභාග රේගුලාසීන් ප්‍රකාර යම්කිසි අයදුම්කරුවෙකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ අපේක්ෂකයාට සුදුසුකම් නැති බව අනාවරණය වූවහොත් අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අපේක්ෂයෙක්ම තම අත්සන සහතික කිරීම අත්‍යාවශ්‍යයි.** රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අපේක්ෂකයෙක් තම ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුදහමුදා, ගුවන් හමුදා යනාදියේ අණ ලැබූ නිලධාරියෙකු, රුපියල් 395,520.00 ට නොඅඩු වටිනාකමින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, ආගමික නිකායන් භාරව සිටින ආගමික නායකයන් යන අයගෙන් කෙනෙකු ස්ථිර කළ යුතු.

## 12. විභාග සැලැස්ම :-

මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර දෙකකින් යුත් ප්‍රශ්න පත්‍ර වන අතර මෙය දෙමළ හා සිංහල යන ද්විත්ව භාෂාවන්ගෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇත. අයදුම් කරන ලද භාෂාව පසුව

වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලබන අතර මෙම ලිඛිත විභාගයට පෙනී සිටි අපේක්ෂකයන් කිසිවෙකුට නැවත නිවැරදි කිරීමට ඉල්ලුම් කිරීම සඳහා විධිවිධාන යොදා නැත.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය මාලාව | වෙලාව | ලකුණු |
|---|---|---|---|---|
| 01. | අභියෝගයතා හා සාමාන්‍ය දැනුම | **කොටස – I :- අභියෝගයතා** මෙම ප්‍රශ්න පත්‍රය සරල භාෂා හැකියාව, සංඛ්‍යාතික හැකියාවන්, තීරණය කිරීමේ හැකියාව, හොඳ ආකල්ප හා අපේක්ෂකයාගේ විනය යන කරුණු ඇතුළත් වේ. **කොටස – I :- සාමාන්‍ය දැනුම** මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, දේශපාලන, සමාජ, සංස්කෘතියහ ා තාක්ෂණික විෂයන් සම්බන්ධයෙන් අභ්‍යන්තර හා ජාත්‍යන්තර වශයෙන් අපේක්ෂයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලැබේ. | පැය 01 | 100 |
| 02. | භාෂා හැකියාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ විනිවිදභාවයේ හැකියව, ග්‍රහණය, උච්චාරණය, භාෂාව හා රචනාව, ලිපිසකස් කිරීම, දී ඇති දත්තවලට අනුව කෙටුම්පත් කිරීම, ජේද කෙටි කිරීම, බොහෝ වාක්‍ය තනි වාක්‍යයක් සේ සකස් කිරීම හා සරල ව්‍යාකරණ භාවිතය යන විෂයන් සමග සම්බන්ධ කරුණු පරීක්ෂා කිරීමේ ප්‍රශ්න පත්‍රයකි | පැය 01 යි මිනිත්තු 30 | 100 |

**සටහන** :-

මෙම විභාගය එක් තරග විභාගයක් වන බැවින් සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකටම වෙන්කරන ලද ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතු අතර සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් සියයට පනහක් (50%) ක් විභාග අපේක්ෂකයන් ලබාගත යුතුයි. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරග විභාගයෙන් ලබාගත් මුළු ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ (Merit Order) සැලකිල්ලට ගනු ලැබේ.

13. විභාගය පැවැත්වීමට අපේක්ෂිත විභාග නගර හා එම නගරවලට අදාල අංක,

| නගරය | නගර අංකය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| යාපනය | 01 | මාංකුලම | 06 |
| මන්නාරම | 02 | චාවකච්චේරිය | 07 |
| වවුනියාව | 03 | පේදුරුතුඩුව | 08 |
| කිලිනොච්චිය | 04 | චුන්නාගම් | 09 |
| මුලයිතීව් | 05 | වෙලනයි | 10 |

එක් විභාග නගරයක් සඳහා ලැබෙන අයදුම්පත්වල සංඛ්‍යාව අඩුවන අවස්ථාවකදී මෙම විභාග මධ්‍යස්ථානයට ආසන්න නගරයක පිහිටි විභාග මධ්‍යස්ථානයක විභාගය පැවැත්වීමට කටයුතු යෙදීමට ඉඩ ඇත.

14. විභාග අපේක්ෂකයන්ට අදාල විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් අන්තර්ජාලය මඟින් නිකුත් කරනු ලැබේ. ඉන් අනතුරුව විභාගයට පෙනී සිටි සෑම අපේක්ෂකයෙකුටම වෙන වෙනම තැපැල් මඟින් නිකුත් කරනු ලැබේ.

15. මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුව ඇත. දෙමළ හා සිංහල මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනුකූලතාවය අතර වෙනසක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

16. මෙම විභාගය සම්බන්ධ නිවේදනය www.np.gov.lk යන උතුරු පළාත් වෙබ් අඩවියට පිවිසීමෙන් බලා ගත හැකිය.

***අ. සිවපාලසුන්දරන්,***
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
05.11.2018